
ආයතනයක වගතුග

# රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව

## හෙළි කරන සැඟවුණු රහස්




තහනම් මත්පැන් බව සහතික කොට අධිකරණයට යැවීමට සූදනම් කර ඇති මත්පැන් තොගය

තරුණයකු වෙඩි තබා ඝාතනය කර ඇත. පශ්චාත් මරණ පරීක්ෂණයේ දි පපු පෙදෙසේ ඇට කැබැලි තුළ සිරවී තිබී උණ්ඩ දෙකක් සොයා ගැනිණි. සිද්ධිය පිළිබඳ සැකකරුවන් අත් අඩංගුවට ගන්නා ලෙස ඒ වනවිටත් අධිකරණය මගින් පොලිසියට නියෝග කොට තිබුණි. ගතවූයේ දින කිහිපයකි. සැකකරුවකු ගිනි අවියක් සමග අත් අඩංගුවට ගෙන අධිකරණය හමුවට කැඳවිණි.

සැකකරු සතුව තිබූ ගිනි අවිය හා පශ්චාත් මරණ පරීක්ෂණයේ දි සොයාගත් උණ්ඩ යුගල වැඩිදුර පරීක්ෂණය සඳහා එක්තරා දෙපාර්තමේන්තුවකට අධිකරණය විසින් යොමු කරනු ලැබිණි. පරීක්ෂණය සඳහා ලැබුණු ගිනි අවියට ජීව පතරෝම් දමා වෙඩි තබා ලබා ගත් උණ්ඩත්, පශ්චාත් මරණ පරීක්ෂණයේ දී මළ සිරුරෙන් ලබා ගත් උණ්ඩත් විශේෂඥයකු විසින් නියුණුව නිරීක්ෂණයට හා පරීක්ෂණයට ලක් කරන ලදී.

පරීක්ෂණය සඳහා ගිනි අවියෙන් වෙඩි තබා ලබා ගත් උණ්ඩවල ලක්ෂණ සහ මළ සිරුරේ තිබූ උණ්ඩවල ලක්ෂණ සමාන බව මෙහිදී විශේෂඥවරයාට පසක් විණි. තවදුරටත් දැඩිව අධ්‍යයනය කළ ඔහු මනුෂ්‍ය ඝාතනය සඳහා එම ගිනි අවිය යොදා ගෙන ඇති බව සාක්ෂි මගින් ඔප්පු කොට අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කළේ ය. වාර්තාවේ කරුණු පරීක්ෂා කළ අධිකරණය මනුෂ්‍ය ඝාතනය සිදු කිරීම සම්බන්ධයෙන් සැකකරුට බරපතල දණ්ඩනයක් නියම කළේ ය.



රජයේ රස පරීක්ෂක
එම්. ඒ. ජේ. මැන්දිස් මහතා

එය සැබැවින් ම බහුකාර්ය ආයතනයකි. විවිධ වූ ආපදා, තීරණාත්මක අවස්ථා හා ජන ජීවිතයට බලපාන කාර්යන්වල දී මෙම ආයතනයේ දායකත්වය අත්‍යවශ්‍ය ය. යම් කරුණක් අරබයා අවසාන නිගමනයකට පැමිණීමට ද මෙම ආයතනයේ පරීක්ෂණ ඉවහල් වේ. නිහඬව, ඉතා පෘථුල වූ කාර්යයන් සමුදයක් ඉටු කරන මෙම ආයතනයේ නතු සොයා පසුගිය දිනෙක එයට ගොඩවැදුනෙමු.

**ඒ රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවයි.**

බෝම්බ පිපිරීම් අපේ රටට සුලබ දෙයකි. පුපුරා ගිය බෝම්බය නිසා විනාශ වූ සුන්බුන් මතින් සිදු කරන පරීක්ෂණ ඔස්සේ ලබාගත් තොරතුරු අනුව එකී බෝම්බයේ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය, පුපුරණ ද්‍රව්‍ය නාමය හා සංයුතිය ආදී කරුණු සොයා ගැනීමට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලැබෙන්නේ නොමඳ සහයකි. ව්‍යාජ අන්දමින් වෙනස් කරන ලද වාහනයක, ගිනි අවියක, තහනම් මත් පැන් - මත් ද්‍රව්‍යවල, ලේඛනයක, ඔප්පුවක හෝ මුදල් නෝට්ටුවක නිරවුල්භාවය සොයා ගැනීමට ද අධිකරණ නියෝග මත මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කර යි. මිනිස් පරිභෝජනය සඳහා වෙළෙඳ පොළේ ඇති විවිධ වූ ආහාර මනුෂ්‍ය පරිභෝජනයට උචිත ද යන්න සොයා බැලීම සඳහා ද මෙහි නිරතුරුව ම පර්යේෂණ සිදු කෙරෙයි. වස විස කෑමෙන් මිය යෑම, ගිනි අවි හෝ අන්තරාදායක ආයුධයක් නිසා සිදුවන මනුෂ්‍ය ඝාතන, සොයා බැලීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරෙන වගකීමකි. මේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරෙන කාර්ය සමුදයෙන් කිහිපයකි.

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට දශක නවයකට ආසන්න දිගු ඉතිහාසයක් ඇත. කොළඹ වෛද්‍ය විද්‍යාලය යටතේ කුඩා ඒකකයක් ලෙස 1904 දී එය වෛද්‍ය විද්‍යාලය තුළ ම ඇරඹිණි. එහි දී ප්‍රථම රස පරීක්ෂකවරයා වූයේ **කේ. එල්. බ්‍රවුනින්** ය. වෛද්‍ය විද්‍යාලය යටතේ තිබූ රස පරීක්ෂක අංශය 1913 දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපිත විණි. 1934 වන විට ටොරින්ටන් චතුරශ්‍රයේ වත්මන් ගොඩනැගිලි සංකීර්ණය වෙත රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවක් ලැබිණි. ප්‍රථම ශ්‍රී ලාංකීය රජයේ රස පරීක්ෂක වරයා වූයේ **ඩබ්ලිව්. ආර්. චම්මුගම්** ය. ඔහු 1945 දි එම ධුරයට පත්විණි.

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වත්මන්



මනුෂ්‍ය ඝාතනයකට යොදා ගත් මිලි මීටර 9 පිස්තෝලයක් පරීක්ෂා කරන සහකාර රස පරීක්ෂක පී. ජී. මඩවල මහතා

නියමුවා ලෙස භාරදූර වගකීමක් ඉටු කරන්නේ **එම්. ඒ. ජේ. මැන්දිස් මහතා යි.** රජයේ රස පරීක්ෂක ලෙස අභිනව තනතුරට පත් වූ උණුසුම මැකී යන්නටත් පෙරාතුව ම ඔහු "නවයුගය" හා පිළිසඳරක යෙදිණි.

අධිකරණ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂඥ උපදේශක සහ විශ්ලේෂණ සේවා සැපයීම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ම කාර්ය භාරය බව රජයේ රස පරීක්ෂක **එම්. ඒ. ජේ. මෙන්ඩිස් මහතා** පවසයි.

මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාදාමය, අංශ දෙකක් ඔස්සේ සිදු වෙයි.

**1. අධිකරණ විද්‍යා අංශය**

අධිකරණ කාර්යයන් සඳහා ඇවැසි කාර්යයන්වල දී මෙම අංශය සෘජුවම දායක වෙයි. නඩුවක් ඉදිරියට ගෙනයෑමේ දී අවශ්‍ය තොරතුරු භාණ්ඩ ඉදිරිපත් කෙරේ.

මෙම අංශය යටතේ තවත් අනු අංශ ගණනාවකි.

(i) ප්‍රක්ෂේප විද්‍යා අංශය –

වෙඩි තැබීම් කාර්යයන් පිළිබඳ පර්යේෂණ කෙරේ.

(ii) පුපුරන ද්‍රව්‍ය, පිපිරීම හා ගිනි අවි අංශය

(iii) වස්තු විද්‍යා අංශය –

රුධිරයේ ශුක්‍රාණු හා කෙස් සම්බන්ධව පර්යේෂණ කෙරේ

(iv) ධූලක විද්‍යා අංශය –

වස විස පිළිබඳ පර්යේෂණ කෙරේ.

(v) විස මත්ද්‍රව්‍ය අංශය

(vi) සැකකටයුතු ලේඛන අංශය

(2) **ආහාර විද්‍යා අංශය**

මෙය කොටස් දෙකකට බෙදේ

(i) ආහාර අංශය –

පරිභෝජනය කරන ආහාර වර්ග


(ii) ආහාර නොවන අංශය –

ජලය, රෙදිපිළි හා මත්පැන් ආදිය



**මුල් අංකය වෙනස් කරන ලද තුවක්කුවක සැබෑ අංකය සොයා ගැනීමට තැත් කරන ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක ආර්. ඩී. සී. ජයවීර මහතා**

උසාවි, පොලිස්, රේගුව, සුරාබදු, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, වරාය කොමිසම, වෙනත් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමු කරන, ඉදිරිපත් කරන නඩු භාණ්ඩ විද්‍යාත්මක පර්යේෂණයට ලක් කිරීම මෙන් ම වාර්තා ද නිකුත් කිරීම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සිදු කරයි.




**භාවිත කළ මුද්දරයක් යොද මුදල් ලබා ගත් ලේඛනයක් පරීක්ෂා කරන සහකාර රස පරීක්ෂක ජේ. එම්. ආර්. ජයසුන්දර මහතා**

එසේ ම විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරන ආදර්ශ තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ සිදු කිරීම මෙන් ම ශ්‍රී ලංකා රේගුව යොමු කරන ආදර්ශ තත්ත්ව පාලන කටයුතු හා තීරුබදු වර්ගීකරණය කිරීම යන ද්විත්ව අංශ පිළිබඳව පරීක්ෂා ද රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් කෙරේ. අධිකරණ හා අදාළ අධිකාරීන් විසින් ඉදිරිපත් කරන විවිධාකාර වූ සැකකටයුතු ලිපි ලේඛන පිළිබඳ මෙ මගින් සොයා බැලේ. ඉදිරිපත් කරන නඩු භාණ්ඩ, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත, බනිජතෙල් පනත, සාක්ෂි, සුරාබදු සහ කර්මාන්ත ආඥා පනත්, වස, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, පළිබෝධ නාශක පනත, පරිසර ආරක්ෂණ පනත, පුපුරනද්‍රව්‍ය පනත, කොළඹ වරාය (පාලන) පනත, පොහොර පනත ආදී විවිධ ආඥාපනත් යටතේ අධ්‍යයනය හා පර්යේෂණ කෙරේ. වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවල විද්‍යාත්මක උපදේශක ලෙස ද අවශ්‍ය අවස්ථාවල දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි.

තාක්ෂණික ඇගයීම් කමිටු, පරීක්ෂණ කමිටු, කාර්ය මණ්ඩල හා වෙන්ටර් මණ්ඩල ගණනාවකට විද්‍යාත්මක නිලධාරීන් ගේ සේවය ලබා දීම මෙම දෙපාර්තමේන්තුව සිදු කරයි. විශේෂඥ සහය අවශ්‍ය අවස්ථාවල දී දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක නිලධාරීන් විසින් අපරාධ සිදු වූ ස්ථාන පරීක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි. අධිකරණ හා කොමිසම් සභා ඉදිරියේ නිකුත් කරන ලද වාර්තා පිළිබඳ ඇරයුම් ලැබුණ විට සාක්ෂි දීම සිදු කිරීම ද මෙම දෙපාර්තමේන්තුව ඉටු කරන තවත් කාර්යයකි. වරාය අධිකාරිය විසින් මෝදර පිහිටුවා ඇති තෙල් ගබඩාවල ඇති තෙල්වල තත්ත්වය පරීක්ෂා කිරීමේ දී ද ආයතනය මඟින් විද්‍යාත්මක නිලධාරීන් යොදවයි.

ආහාර පනත යටතේ කොළඹ සහ මහනුවර මහ නගර සභා හැර අනෙකුත් පළාත් පාලන ආයතන සියල්ල ම සඳහා සහ සුවඳ විලවුන් වර්ග පිළිබඳ උපක්‍රම හා ඖෂධ පනත යටතේ රජයේ රසපරීක්ෂකවරයා අනුමත කරන ලද රස පරීක්ෂක ලෙස ක්‍රියා කරයි. එසේ ම රජයේ රසපරීක්ෂකවරයා, පළිබෝධ නාශක පනත හා පරිසර ආරක්ෂක පනත යටතේ විනිශ්චය රස පරීක්ෂක ලෙස ද ක්‍රියා කරයි.

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අධිකරණ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ පූර්ණ අනුමැතිය සහිත කොළඹ නැව් නටාංගනය ඇතුළු සංස්ථා ස්ථාපිත මණ්ඩල සහ පුද්ගලික පාර්ශවයන්ට ද විශේෂඥ සේවය සපය යි. මේ සඳහා ලිඛිතව ඉල්ලීම් කිරීමෙන් අවශ්‍ය සේවා පුද්ගලික අංශයට ද ලබා ගත හැකි ය. ඊට සේවා සැපයීම වෙනුවෙන් ගෙවීමක් ද සිදු කළ යුතු ය. විවිධ අංශ ඔස්සේ මෙහි නිතිපතා සිදුවන පර්යේෂණ රාශියකි.




**ආරක්ෂක අංශ සොයාගත් පුපුරන ද්‍රව්‍ය පරීක්ෂා කරන ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක ඩබ්ලිව්. ඩී. ජී. එස්. ගුණතිලක මහතා**

ඒ සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකයන් ඇතුළු සහකාර රස පරීක්ෂකවරු දැඩි ඕනෑකමකින් පර්යේෂණවල නිරත වෙති.

තැනෙක ව්‍යාජ ලෙස මුල් අංකය වෙනස් කරන ලද ගිනි අවියක මුල් අංකය සොයා ගැනීමට යත්න දරයි. ආහාර වර්ගවල මිනිස් ශරීරයට අහිතකර යමක් වේද යන්න තවත් තැනෙක සොයා බැලෙයි. මනුෂ්‍ය ඝාතනයක් සඳහා යොදගත් ගිනි අවියක් හා ව්‍යාජ අත්දමින් මුදල් ලබාගත් ලේඛනයක් තවත් තැනෙක පරීක්ෂා කෙරේ. මෙලෙස විවිධ වූ පර්යේෂණ රාශියක් සෑම දිනක ම සිදු වේ.

මෙසා පැවැරුණු වගකීම් රාශියක් ඉටුකරමින් අඛණ්ඩව සේවා පවත්වාගත යුමේ කර්තව්‍ය භාරගෙන සිටින රජයේ **රසපරීක්ෂක එම්. ඒ. ජේ. මැන්දිස්** මහතා අදහස් දක්වමින්,


"දෙපාර්තමේන්තුවක් ලෙස අප නිහඬව සිදු කරන සේවාව විශාල යි. බෝම්බයක් පිපිරුණා ම, ගිනි අවි අසුවුණා ම, මිනීමැරුමක දී, අභිරහස් මරණයක දී, ආහාර ද්‍රව්‍යවල තත්ත්වය සොයා බැලීමකදී හෝ ව්‍යාජ මුදල් නෝට්ටු, ව්‍යාජ ලිපි ලේඛන ආදී බොහෝ කාර්යවල දී අධිකරණයේ සහයට අප ඉදිරිපත් වෙනවා."

යම් සිද්ධියක දී පර්යේෂණ කරන ආකාරය පිළිබඳව කරුණු පැහැදිලි කරන මැන්ඩිස් මහතා,

"වෙඩි තැබීමකින් සිදු වූ ඝාතනයක් නම් ඊට යොද ගත් ගිනි අවිය, වැය වූ පතරොම් කොපු, වෙඩි වැදී අලාභ හානි වූ ඇඳුම ආදී අංග මගින් පර්යේෂණ කර සත්‍ය තොරතුරු අනාවරණය කරනවා. ඒ වගේම බෝම්බ පිපිරීමක දී, සුන්බුන් මගින් බෝම්බය පිළිබඳ තොරතුරු හෙළි කරනවා. වස විස මගින් සිදුවන මරණයක දී අධිකරණ වෛද්‍යවරයා ඉදිරිපත් කරන ශාරීරික කොටස් පරීක්ෂා කොට වාර්තා ඉදිරිපත් කරනවා. හමුදා හෝ පොලිසි මගින් සොයා ගන්නා නීති විරෝධී ගිනි අවි පුපුරණ ද්‍රව්‍ය ඇතුළු අන්තරායදායක අවි ආයුධ, විනාශකාරී ආයුධ බවට ඔප්පු කිරීමට අධිකරණයට අපේ සහය අවශ්‍යයි.

විදේශ රටවල අධිකරණ හා ආහාර විද්‍යාගාර වෙන වෙනම ම පිහිටුවා තිබෙනවා. පර්යේෂණ පුළුල් ලෙස කරගන යාමට එය පහසුවක්. එහෙත් වියදම් අධිකයි. නමුත් අපේ රටේ එකම අධිකරණ විද්‍යාගාරය හා ප්‍රධාන ආහාර විද්‍යාගාරය එකටයි තියෙන්නේ. මෙය එක් අතකින් අවාසිදායක තත්ත්වයක්. පුළුල් පර්යේෂණවලට එය බාධාවක්.

සුදුසුකම් ඇති අයගේ පුරප්පාඩුවලින් අප දෙපාර්තමේන්තුව නිතර පෙළෙනවා. රසායනික විද්‍යා විශේෂවේදී උපාධිය, ඉහළ පෙළේ හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් සමග සමත් උපාධිධාරීන්ට අප දෙපාර්තමේන්තුවට බැඳිය හැකියි. ඒ සඳහා ගැසට් කර පවත්වන තරග විභාගයකට හා සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දිය යුතුයි. විද්‍යාත්මක නිලධාරීන් 42 ක් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වුවත් එය සම්පූර්ණයෙන් පිරවීමට කවදාවත් හැකිවෙලා නැහැ. අදටත් 9 දෙනකු ගේ පුරප්පාඩු තිබෙනවා.



**බියර්වල තත්ත්වය පරීක්ෂා කරන සහකාර රස පරීක්ෂක එස්. පී. හපුතන්ත්‍රි මහත්මිය**



**මිරිස් කුඩුවල තත්ත්වය පරීක්ෂා කරන සහකාර රස පරීක්ෂක සමන්තා විමලසේන මහත්මිය**


පර්යේෂවලට අවශ්‍ය සෑම උපකරණයක් ම අප සතුව තිබීම සතුටට කරුණක්. එහෙත් මාතෘ, පිතෘභාව සොයා ගැනීමට හැකි D. N. A. (අංශ චිත්‍ර කර්ම) උපකරණ අප සතුව නැහැ. ඒවා රුපියල් කෝටි ගණනක් වෙනවා.

යම්කිසි සිද්ධියක දී ජනතාව ගේ සහය අපට වැදගත් වෙනවා. නිදසුනක් ලෙස මනුෂ්‍ය ඝාතනයක දී හෝ අභිරහස් මරණයක දී, සත්‍ය තොරතුරු ගවේෂණය කිරීම සඳහා එකී සිද්ධිය වූ ස්ථානයේ පවත්නා ස්වභාවය වැදගත් වෙනවා. අවශ්‍ය සාක්ෂි ඒ අවට තිබිය හැකියි. පිහිය, හිස් පතරොම්, ලණු කැබලි මීට නිදසුන්. එවැනි ස්ථානවලට ඇතුළු නොවී පොලිසියට දැන්විය යුතු යි. සිද්ධිය වූ ස්ථානය හා අවට අදාළ නිලධාරීන් පැමිණෙන තෙක් ආරක්ෂා කර ගත යුතු වනවා.

පසුගිය වසර පහ තුළ අපේ නිලධාරීන්ට විදේශ රටවල පුහුණුව සඳහා ශිෂ්‍යත්ව ලැබී නැහැ. විදේශ අධ්‍යාපනය මේ ක්ෂේත්‍රයට විශාල රුකුලක්. නවීන ක්‍රම, උපකරණ භාවිතය එමගින් ඉගෙන ගැනීමට හැකියාව ලැබෙනවා. එනිසා අප දෙපාර්තමේන්තුවේ මුදල් වලින් හෝ නිලධාරීන්ට විදේශ පුහුණුව ලබාදීමට කටයුතු කරනවා.

තමන් පානය කරන ජලය අපිරිසිදු නම් මේ පිළිබඳ පර්යේෂණ කිරීමට අප වෙත යොමු කිරීමට ජනතාවට අවස්ථාව තිබෙනවා. නිෂ්පාදන භාණ්ඩයක ප්‍රමිතිය පිළිබඳව අප සහතික නිකුත් කරනවා. පරිභෝජනය සඳහා ඇති ආහාර පාන සෞඛ්‍ය නිලධාරීන් මගින් අප වෙත යොමු කරීමට ද ජනතාවට හැකියාව තිබෙනවා. කර්මාන්ත ශාලාවකින් පිටවෙන අපද්‍රව්‍ය හෝ විෂ සහිත වායුව නිසා ජනතාව අනතුරකට මුහුණ පාන්නේ නම් අධිකරණ නියෝග මත ඒ පිළිබඳ සොයා බැලීමට ද අපට බලය තිබෙනවා.

පවත්නා පහසුකම්වලින් උපරිම ප්‍රයෝජනය ගෙන අපට පැවරී ඇති රාජකාරිය විශිෂ්ට අන්දමින් ඉටු කිරීමට ක්‍රියා කරනවා. ❑



**වෙළෙඳ පොළේ ඇති එළඟිතෙල්වල තත්ත්වය පරීක්ෂා කරන සහකාර රස පරීක්ෂක දීපිකා සෙනෙවිරත්න මහත්මිය**

**සටහන**

**සමන්ත මල්ලවආරච්චි**

**ඡායාරූප**

**වි. ඩී. සිරිසේන**